# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1984 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 60 යි.

# 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 86/80.

**ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනයක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 3 දරන ඇඟලුම් නිෂ්පාදන කාර්මාන්ත අභ්‍යාස ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පිහිටුවීම

2. (1) මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන, "ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ තත්කාලයෙහි ආයතනයේ සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් එය සමන්විත විය යුතු ය. ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය පිහිටුවීම.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ස්වකීය සංස්ථාගත නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. ආයතනය පිහිටුවනු ලබන්නේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ මූලික වශයෙන් ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය ඇතුළත කාර්මික හා කළමනාකරණ දක්ෂතා ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සහ, විශේෂයෙන් ම— ආයතනයේ පරමාර්ථ.

(අ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයට අදාළ වූ ද ඇඟලුම් නිෂ්පාදනයේ අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ වූ ද පුහුණු වීමේ පහසුකම් හා වැඩ සටහන් සැලසීමෙන් හෝ ක්‍රියාත්මක කිරීමෙන් කම්කරුවන්ගේ සහ විධායක නිලධරයන්ගේ වෘත්තීය හැකියාව ප්‍රවර්ධනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් සහතික පත්‍ර, අභිඥ පත්‍ර, උපාධි සහ ත්‍යාග ප්‍රදානය කිරීම ;

(ආ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය හා සම්බන්ධ අධ්‍යයන කටයුතු පෝෂණය කිරීම සහ ඒවාට ආධාර කිරීම ;

(ඇ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයේ කාර්මික ඒකකවලට කාර්මික හා ආර්ථික උපදේශක සේවා සැලසීම ;

(ඈ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය පුහුණුවීමට අදාළ සම්මේලන වැඩමුළු හා සම්මන්ත්‍රණවලට සමානුග්‍රහය දැක්වීම, ඒවා පැවැත්වීම හා පුවත්පත් සහ සඟරා පළ කිරීම ;

(ඉ) ඇඟලුම් නිෂ්පාදනය කිරීමේ ක්ෂේත්‍රයෙහි වූ හෝ සමාන ස්වභාවයකින් යුත් වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(ඊ) කාර්මික ඒකකවල නිශ්චිත කාර්මික ගැටළු අධ්‍යයනය කිරීම සහ අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් දීම

උදෙසා යොමු කරනු ලැබිය යුතු ය.

ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

4. ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට යුක්ති සහගත ලෙස අවශ්‍ය විය හැකි යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ආයතනය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු අතර, විශේෂයෙන් ම—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම හා දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයට අදාළ, ක්ෂේත්‍ර අභ්‍යාස මධ්‍යස්ථාන හා නියමු යෝජනා ක්‍රම අත්කර ගැනීම, පිහිටුවීම, ඉදිකිරීම සහ මෙහෙයවීම;

(ඇ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා උපකරණ, අරමුදල්, සේවක පිරිස් සහ වෙනත් යම් ආධාර භාර ගැනීම;

(ඈ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයේ සියලු අංග සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම, ඒවාට ආධාර කිරීම, ඒවා සම්බන්ධීකරණය කිරීම සහ දිරිගැන්වීම;

(ඉ) ආයතනය විසින් දෙනු ලබන යම් පුහුණුවක් හෝ සලසනු ලබන සේවාවන් සඳහා ගාස්තු හෝ අයකිරීම් නියම කිරීම;

(ඊ) ස්වකීය සේවානියුක්තයන් සඳහා සුභසාධක හා විනෝද පහසුකම් සැලසීම;

(උ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(ඌ) ස්වකීය කටයුතු කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි පාලක මණ්ඩලය විසින් සලකනු ලබන යම් කර්තව්‍ය යම් සාමාජිකයකුට, ආයතනයේ අධ්‍යක්ෂවරයාට හෝ යම් සේවා නියුක්තයකුට පැවරීම;

(එ) ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයට අදාළව ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය යයි පාලක මණ්ඩලය විසින් සලකනු ලබන විමර්ශන පැවැත්වීමේ සහ දත්ත වාර්තාගත කිරීමේ, පොත් සහ ලේඛන පරීක්ෂා කිරීමේ සහ ඒවායේ පිටපත් හෝ උධෘත ගැනීමේ කාර්යය සඳහා යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීම; සහ

(ඒ) පාලක මණ්ඩලයේ මතය අනුව, ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ නැතහොත් එහි ලා ආනුෂංගික වන්නා වූ වෙනත් සියලු දේ

ආයතනය විසින් කළ හැකි ය.

ආයතනය විසින් ස්වකීය බලතල අමාත්‍යවරයාගේ විධාන පරිදි ක්‍රියාත්මක කළ යුතු බව.

5. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ස්වකීය පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමේ දී ආයතනය විසින්, ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් අනුගමනය කරනු ලබන පොදු ප්‍රතිපත්තියට අනුකූලව ද ඒ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන වලට අනුකූලව ද ක්‍රියා කරනු ලැබිය යුතු ය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

6. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් ආයතනයට තිබිය යුතු ය:—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු—

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; නැතහොත්

(ii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වෙනත් යම් නිලධරයකු;

(ආ) ජාතික ආධුනිකත්වය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයකු;

(ඇ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාට භාර අමාත්‍යාංශයේ නිලධරයකු;

(ඈ) ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමයේ නියෝජිතයකු;

(ඉ) ඇඟලුම් නිෂ්පාදකයන්ගේ සංගමයේ නියෝජිතයකු;

(ඊ) මෙස් ආදී ද්‍රව්‍ය නිෂ්පාදකයන්ගේ සංගමයේ නියෝජිතයකු;

(උ) පේෂකර්ම ආයතනයේ (ශ්‍රී ලංකා ශාඛාව) සභාපතිවරයා; සහ

(ඌ) එක් සාමාජිකයකු අත් යන්ත්‍ර රෙදි කර්මාන්තයෙන් වන පරිදි, වෙනත් සාමාජිකයන් දෙදෙනකු.

සාමාජිකයන් වීම සඳහා නුසුදුසුකම්.

7. යම්කිසි තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත්වන්නේ නම්;

(ආ) ආයතනය විසින් හෝ ආයතනය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් දරන්නේ නම් හෝ භුක්තිවිඳින්නේ නම්; නැතහොත්

(ඇ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තමා විසින් තම කර්තව්‍ය ඉටු කිරීමේ දී හානිකර ලෙස බලපෑමට ඉඩ ඇත්තා වූ යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට සුදුස්සෙක් නොවන්නේ ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

8. 6 වන වගන්තිය යටතේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම, මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් තම ධුරය හිස් කරනහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

සාමාජිකයන් මියයාම, ධුරයෙන් ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම.

9. (1) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ යම් සාමාජිකයකුට කිසියම් අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යානුකූල යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ සඳහා කිසිම හේතුවක් නොදක්වා ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද ඒ සාමාජිකයා පත් කරනු ලැබුවේ යම් අමාත්‍යවරයකුගේ අදහස් විමසීමෙන් පසුව ද නැතහොත් ඒ සාමාජිකයා නම් කරනු ලැබුවේ යම් අධිකාරියක් විසින් ද ඒ අමාත්‍යවරයාගේ හෝ අධිකාරියේ අදහස් විමසා හැර මේ උපවගන්තිය යටතේ කිසිම සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ මරණය සිදු වූ විට හෝ යම් සාමාජිකයකු විසින් ධුරය හිස් කරනු ලැබූ විට නැතහොත් ඉහතින් වූ උපවගන්තිවල විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට, 6 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයෙන්ම අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එවැනි සාමාජිකයකු වෙනුවට පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) අසනීපවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මණ්ඩලයේ යම් සාමාජිකයකුට යම් කාලයක් තුළ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත්, 6 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයෙන්ම ඒ කාලය තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(5) සභාපතිවරයා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අවස්ථාවක, ඒ සභාපතිවරයාට සහ 6 වන වගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයාට මේ වගන්තියේ (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

**පුරප්පාඩුවක් තිබීම හේතුවෙන් ක්‍රියා බලරහිත නොවන බව.**

**10.** මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් නැතහොත් කටයුත්තක් බලරහිත නොවන්නේ ය.

**මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.**

**11.** අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ආයතනයේ අරමුදලින් මණ්ඩලයේ සාමාජිකයන්ට යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

**මණ්ඩලයේ රැස්වීම.**

**12.** මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම් සඳහා ගණපූරණය හා ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

**බලතල, කර්තව්‍ය හෝ කාර්ය පැවරීම.**

**13.** (1) මණ්ඩලය විසින් ස්වකීය බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට හෝ ආයතනයේ අධ්‍යක්ෂවරයාට හෝ ආයතනයේ යම් සේවා නියුක්තයකුට පවරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් (1) වන උපවගන්තිය යටතේ පවරනු ලැබූ සභාපතිවරයා, වෙනත් සාමාජිකයා, අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා විසින් එසේ පවරන ලද බලතල, කර්තව්‍ය හෝ කාර්ය මණ්ඩලයේ විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ක්‍රියාත්මක කළ යුතු ය; නැතහොත් ඉටු කළ යුතු ය.

**මණ්ඩලයේ උපසභාපතිවරයා.**

**14.** (1) අමාත්‍යවරයා විසින් සභාපතිවරයා විමසා, 6 වන වගන්තිය යටතේ තමා විසින් පත් කරන ලද සාමාජිකයන් අතුරින් උපසභාපතිවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ වෙනත් අබලතාවක් නිසා නැතහොත් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට හෝ උපසභාපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අනෙක් සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(3) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක උපසභාපතිවරයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැති විටක (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් කාරණයක් සම්බන්ධයෙන් දී ඇති ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, ඒ රැස්වීමේ සභාපතිවරයාට, තම ඡන්දයට අතිරේකව ද්විතීය නොහොත් තීරක ඡන්දයක් ඇත්තේ ය.

ආයතනයේ කටයුතු මණ්ඩලය විසින් පරිපාලනය කළ යුතු බව.

**15.** ආයතනයේ කටයුතු මණ්ඩලය විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය. තව ද ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

ආයතනයේ අධ්‍යක්ෂවරයා.

**16.** (1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ සභාපතිවරයා විමසා ආයතනයේ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ද ඇතුළුව ඔහුගේ සේවා නියුක්තිය පිළිබඳ කොන්දේසි මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලබන යම් බලතල, කර්තව්‍ය හා කාර්ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන පත් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

**17.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්—

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන, හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හා යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සියලු කාරණා හෝ ඉන් යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

රජයේ නිලධරයන් සහ රාජ්‍ය සංස්ථා සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**18.** (1) රජයේ සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට සහ ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවකට, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කරනු ලබන සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය එකඟ වන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ යම් නියම හා කොන්දේසි ද ඇතුළු යම් නියම හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ හා රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් මණ්ඩලය සහ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වන විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළු යම් නියම හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(7) (5) වන හෝ (6) වන උපවගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

ආයතනයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

19. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ආයතනයේ සියලු නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

20. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මුදල්

ආයතනයේ ප්‍රාග්ධනය.

21. (1) ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දෙලක්ෂ පනස් දහසක් විය යුතු අතර, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් නියම හා කොන්දේසි මත ආණ්ඩුව විසින් ඒ ප්‍රාග්ධනය ආයතනයට ලබා දිය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට, ආයතනයේ ප්‍රාග්ධනය, යම් විසර්ජන පනතක් මගින් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් හෝ බලය දෙනු ලබන යම් ප්‍රමාණයකින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි අතර, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත ඒ මුදල් ආධාර වශයෙන් හෝ ණය වශයෙන් ආණ්ඩුව විසින් ආයතනයට ගෙවනු ලැබිය යුතු ය; නැතහොත් ආයතනයට ලබා දිය යුතු ය.

ආයතනයේ අරමුදල.

22. (1) ආයතනයට ආයතනයේම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) මේ පනතින් හෝ මේ පනත යටතේ ඒ අරමුදලට ගෙවීමට නියමිත ගෙවීම්;

(ආ) අභ්‍යාසලාභීන් ලියාපදිංචි කරනු ලැබීමේදී ඔවුන්ගෙන් එකතු කරනු ලබන ගාස්තු;

(ඇ) ආයතනය විසින් සලසන ලද සේවා සඳහා හෝ දෙන ලද පුහුණුව සඳහා අය කරනු ලබන ගාස්තු; සහ

(ඈ) පරිත්‍යාග

විශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා ආයතනය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

23. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය.

24. (1) ආයතනයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම් විගණනය කිරීම.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස
## පොදු විධිවිධාන

25. (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන හා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලබන අවස්ථාවක, ඉඩම් අවශ්‍ය වන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එය අත්කර ගෙන ආයතනය වෙත පවරා දෙනු ලැබිය හැකි ය. ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) ආයතනය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලබන යම් නිශ්චල දේපළක් සඳහා ගෙවිය යුතු යම් මුදලක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

26. (1) ආයතනයේ කාර්යය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දෙනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තවද, ඒ අනුව ආයතනයට ඒ දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් වශයෙන් දීමේ දී ඒ විශේෂ ප්‍රදානයට හෝ බද්දට ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය. නිශ්චල හා චංචල දෙවර්ගයේම රජයේ දේපළ ආයතනයට ලබාගත හැකි විය යුතු බව.

(2) ආයතනයේ කාර්යය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ඒ චංචල දේපළ විෂයෙහි පාලනය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ඒ චංචල දේපළෙහි සන්තකය හා පරිහරණය ආයතනය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය.

27. ආයතනයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් ආණ්ඩුව විසින් සලසනු ලැබිය හැකි ය. ආයතනයේ ප්‍රයෝජනය සඳහා ස්ථාන ආදිය ලබා ගැනීමට ආණ්ඩුව විසින් සැලැස්විය හැකි බව.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි හෝ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**28.** (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව; සහ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු නැතහොත් ආයතනයේ යම් සේවා නියුක්තයකු හෝ මණ්ඩලයේ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, සේවා නියුක්තයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඒ තැනැත්තාට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදම්, එය සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් ලෙස අධිකරණය තීරණය කරතහොත් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම පිට ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු බව.

**29.** ආයතනයට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම පිට ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

මණ්ඩලයට හෝ එහි යම් සාමාජිකයකුට හෝ මණ්ඩලයේ අධිකාරය යටතේ ක්‍රියා කරන යම් සේවා නියුක්තයකුට හෝ යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවීමට ඇති බලය.

**30.** ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන අවස්ථාවක දී පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම සහ දත්ත වාර්තාගත කිරීම සඳහා මණ්ඩලය විසින් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ ආයතනයේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ යම් ඉඩමකට හෝ ස්ථානයකට නැත හොත් යම් ඉඩමක් හෝ ස්ථානයක් තුළට ඇතුළුවීම සඳහා බලය දීම නීත්‍යානුකූල වන්නේ ය.

31. 30 වන වගන්තියෙහි සඳහන් යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වා ගෙන යාමේ දී මණ්ඩලය හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මණ්ඩලය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු වළක්වන හෝ ඔහුට බාධා කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

මණ්ඩලය හෝ යම් සාමාජිකයකු හෝ බලය දෙනු ලැබූ සේවා නියුක්තයකු හෝ වළක්වන නැතහොත් ඔහුට අවහිර කරන යම් තැනැත්තකු වරදකරු වීම.

32. (1) මේ පනතේ 4 වන වගන්තිය යටතේ ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමට, කර්තව්‍ය ඉටු කිරීමට සහ කාර්ය කිරීමට ආයතනයට හැකි වනු පිණිස, මණ්ඩලයේ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු හෝ විසින්, ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙන් ඉල්ලා ඇති තොරතුරු ඒ දැන්වීමෙහි සඳහන් කාල පරිච්ඡේදය තුළ දී සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

තොරතුරු ලබා ගැනීමට ඇති බලය.

(2) යම් තොරතුරක් සපයන ලෙස (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, ඒ තොරතුරු සැපයීමෙන් ඒ තැනැත්තා යම් නීතියක විධිවිධාන යටතේ වළක්වාලනු ලබන්නේ නම් මිස, ඒ දැන්වීමෙහි සඳහන් කාල පරිච්ඡේදය තුළ දී ඒ තොරතුරු සැපයීම ඒ තැනැත්තා සතු කාර්යයක් වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම යුක්තිසහගත හේතුවක් නොමැතිව පැහැර හරින හෝ යම් තොරතුරක් සාවද්‍ය බව දැනදැනම එවැනි සාවද්‍ය තොරතුරක් සපයන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලබා ගන්නා ලද යම් තොරතුරක්, අධිකරණයක් විසින් නියම කරනු ලැබූ විට හෝ ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ලීමේ කාර්යය සඳහා හෝ මිස, යම් තැනැත්තකුට අනාවරණය කිරීම හෝ පාවිච්චි කිරීම, සභාපතිවරයා විසින් හෝ මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෝ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් හෝ ආයතනයේ යම් නිලධරයකු නැතහොත් සේවකයකු විසින් හෝ නොකරනු ලැබිය යුතු ය.

වැරදි සඳහා දණ්ඩනය.

**33.** මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සියයකට නොඅඩු දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

මණ්ඩලය වෙත විශේෂ හෝ සාමාන්‍ය විධාන දීමට අමාත්‍යවරයාට ඇති බලය.

**34.** මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ විශේෂ හෝ සාමාන්‍ය විධාන දිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.

**35.** (1) රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියම කර ඇති කාරණා සියල්ල ම හෝ නැතහොත් යම් කිසි කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.